# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2360/21 - 2023 නොවැම්බර් මස 27 වැනි සඳුදා - 2023.11.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී - 6/2023

**(218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත**

(218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ 77අ වගන්තියේ (6) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 80 වන වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ජනාධිපති නීතිඥ ආචාර්ය **විජයදාස රාජපක්ෂ,**
අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2023 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2023 විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (නඩු භාණ්ඩ බැහැර කිරීම) පිළිබඳ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගවල කාර්ය සඳහා අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයේ හෝ නිසි අධිකරණ බලය සහිත අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් පහත සඳහන් කරුණු අන්තර්ගත මාසික වාර්තා පිළියෙල කරනු ලැබිය යුතු ය :-

(අ) ආඥාපනතේ 77අ වන වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාගේ වාර්තාව ලැබී ඇත්තේ යම් නඩු සම්බන්ධයෙන් ද, එවැනි නඩු;

(ආ) ආඥාපනතේ 77අ වන වගන්තියේ (2) වන උපවගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාගේ වාර්තාව ලැබී නොමැත්තේ යම් නඩු සම්බන්ධයෙන් ද, එවැනි නඩු;


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) ආඥාපනතේ 77අ වන වගන්තියේ (5) වන උපවගන්තිය ප්‍රකාරව (මෙහි මින්මතු ''බලය පවරන ලද තැනැත්තා'' යනුවෙන් සඳහන් කරනු ලබන) පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය විසින් හෝ අදාළ මහෙස්ත්‍රාත්වරයා හෝ නිසි අධිකරණයක විනිශ්චයකාරවරයකු විසින් යම් ඖෂධයක්, ද්‍රව්‍යයක්, භාණ්ඩයක් හෝ සැකසුමක් බැහැර කිරීම සඳහා (මෙහි මින් මතු ''බැහැර කිරීමේ නියෝග'' යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ආඥාවක් ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇත්තේ යම් නඩු සම්බන්ධයෙන් ද, එවැනි නඩු;

(ඈ) ආඥාපනතේ 77අ වන වගන්තියේ (5) වන උපවගන්තිය ප්‍රකාරව, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය විසින් හෝ බලය පවරන ලද තැනැත්තා විසින් බැහැර කිරීමේ ආඥාවක් ලබාදෙන ලෙස ඉල්ලා නොමැත්තේ යම් නඩු සම්බන්ධයෙන් ද, එවැනි නඩු;

(ඉ) ආඥාපනතේ 77අ වන වගන්තියේ (5) වන උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාරව, අවස්ථාවෝචිත පරිදි, අදාළ මහෙස්ත්‍රාත්වරයා විසින් හෝ නිසි අධිකරණයක විනිශ්චයකාරවරයෙකු විසින් බැහැර කිරීමේ ආඥා නිකුත් කර ඇත්තේ යම් නඩු සම්බන්ධයෙන් ද, එවැනි නඩු;

(ඊ) ආඥාපනතේ 77අ වන වගන්තියේ (5) වන උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාරව, අවස්ථාවෝචිත පරිදි, අදාළ මහෙස්ත්‍රාත්වරයා විසින් හෝ නිසි අධිකරණයක විනිශ්චයකාරවරයකු විසින් බැහැර කිරීමේ ආඥාවක් නිකුත් කර නොමැත්තේ යම් නඩු සම්බන්ධයෙන් ද. එවැනි නඩු සහ එසේ ආඥාවක් නිකුත් නොකිරීමට හේතු;

(උ) ආඥාපනතේ 77අ වන වගන්තියේ (5) වන උපවගන්තිය ප්‍රකාරව, අදාළ මහෙස්ත්‍රාත්වරයා විසින් හෝ නිසි අධිකරණයක විනිශ්චයකාරවරයකු විසින් නිකුත් කර ඇති බැහැර කිරීමේ ආඥා ක්‍රියාත්මක කර ඇත්තේ යම් නඩු සම්බන්ධයෙන් ද, එවැනි නඩු;

(ඌ) ආඥාපනතේ 77අ වන වගන්තියේ (5) වන උපවගන්තිය ප්‍රකාරව, අදාළ මහෙස්ත්‍රාත්වරයා විසින් හෝ නිසි අධිකරණයක විනිශ්චයකාරවරයකු විසින් නිකුත් කර ඇති බැහැර කිරීමේ ආඥා ක්‍රියාත්මක කර නොමැත්තේ යම් නඩු සම්බන්ධයෙන් ද, එවැනි නඩු සහ එම ආඥා ක්‍රියාත්මක නොකිරීමට හේතු;

(එ) මේ නියෝගවල කාර්ය සඳහා ඉදිරිපත් කරන ලෙස රෙජිස්ට්‍රාර්වරයා වෙත අදාළ මහේස්ත්‍රාත්වරයා විසින් හෝ නිසි අධිකරණයක විනිශ්චයකාරවරයකු විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු.

3. අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් 2 වන නියෝගයේ දක්වා ඇති මාසික වාර්තාව සෑම මාසයකම පළමු වන සතිය ඇතුළත අදාළ මහෙස්ත්‍රාත්වරයා වෙත හෝ නිසි අධිකරණයක විනිශ්චයකාරවරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.

4. (1) අදාළ මහෙස්ත්‍රාත්වරයා විසින් හෝ නිසි අධිකරණයක විනිශ්චයකාරවරයා විසින්, එම මාසික වාර්තාව ලැබීමේ දින සිට දින හතක කාලසීමාවක් ඇතුළත ඒ සම්බන්ධ උචිත ආඥා නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (මෙහි මින්මතු ''නඩු භාණ්ඩ '' යනුවෙන් සඳහන් කරනු ලබන) මේ නියෝගය යටතේ වූ ඖෂධය, ද්‍රව්‍ය, භාණ්ඩය හෝ සැකසුම විනාශ කිරීම සඳහා වූ යම් ආඥාවක්, පළමු උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බැහැර කිරීමේ පිරිවිතරවලට අනුකූල විය යුතු ය.

5. 6 වන නියෝගයේ විධිවිධානවලට යටත්ව, අදාළ මහෙස්ත්‍රාත්වරයා හෝ නිසි අධිකරණයක විනිශ්චයකාරවරයකු විසින් –

(අ) (i) පැමිණිල්ලේ නීතිඥවරයා විසින් හෝ පැමිණිල්ල මෙහෙයවන පොලිස් නිලධරයා හෝ ඔහුගේ නියෝජිතයකු විසින්;

(ii) විත්තියේ නීතිඥවරයා හෝ ඔහුගේ නියෝජිතයකු විසින්;

(iii) සැකකරු විසින්,

එම නඩු භාණ්ඩ විනාශ කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන විරෝධතා පිළිබඳව සැලකිල්ලට ගැනීමෙන් පසුව හෝ එවැනි යම් තැනැත්තකු විසින් කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් කර නොමැති බවට සහ ආඥාව යුක්තිය ඉටුවීමට පටහැනි නොවන බවට සෑහීමට පත්වීමෙන් පසුව;-

(ආ) නඩු භාණ්ඩවල ඇසුරුම සහ මුද්‍රාව ඇතුළු ඡායාරූප සහ අවශ්‍ය සාක්ෂි, ආඥාපනතේ විධිවිධානවලට අනුකූල බවට සෑහීමට පත්වීමෙන් පසුව,

(ඇ) එම අධිකරණයේ නඩු විභාග කටයුතු සිදු කිරීමේ දී සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීමට හැකියාව ලැබෙන පරිදි නඩු භාණ්ඩවලට අදාළ ඇසුරුම් සහ මුද්‍රාවන් ඇතුළු අවශ්‍ය සාක්ෂි සංරක්ෂණය කර ආරක්ෂිතව පවතින බවට සෑහීමට පත්වීමෙන් පසුව,

ආඥාපනතේ 77අ වන වගන්තියේ (5) වන උපවගන්තිය ප්‍රකාරව, එම නඩු භාණ්ඩ විනාශ කිරීම සඳහා ආඥාවක් නිකුත් කරනු ලැබිය යුතු ය.

6. අදාළ මහෙස්ත්‍රාත්වරයා විසින් හෝ නිසි අධිකරණයක විනිශ්චයකාරවරයකු විසින් නීතිපතිවරයාගෙන් සහ නඩු භාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කරන ලද අදාළ පොලිස් නිලධරයාගේ නිරීක්ෂණ ලබා ගැනීමෙන් පසුව, අවශ්‍ය වේ නම් යම් විමර්ශනයක්, පුහුණුවක්, පර්යේෂණයක් සහ වෛද්‍ය ඖෂධ සැකසීම සඳහා එසේ විනාශ කරන ලෙස ආඥාවක් ලබා දී ඇති නඩු භාණ්ඩවලින් උචිත යම් ප්‍රමාණයක් නිදහස් කිරීම සඳහා එම මහෙස්ත්‍රාත්වරයාට හෝ විනිශ්චයකාරවරයාට බලය තිබිය යුතු ය.

එසේ වුවද, මේ නියෝගය ප්‍රකාරව මුදාහරිනු ලබන එම නඩු භාණ්ඩ -

(අ) කිසිදු අවස්ථාවක දී, එම විමර්ශනය, පුහුණුව, පර්යේෂණය සහ වෛද්‍ය ඖෂධ සැකසීම සඳහා අවශ්‍ය වන බර ප්‍රමාණය නොඉක්මවිය යුතු ය ; සහ

(ආ) තත්කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරී බලය යටතේ ලබාගත හැකි සහ සන්තකයේ තබාගත හැකි ඖෂධයක්, ද්‍රව්‍යයක්, භාණ්ඩයක් හෝ සැකසුමක් විය යුතු ය.

එසේම තවදුරටත්, යම් ලිඛිත නීතියක් යටතේ වූ බලපත්‍රයක අධිකාරී බලය යටතේ නිකුත් කොට ඇති බලපත්‍රයක් යටතේ ලබාගත නොහැකි හෝ සන්තකයේ තබාගත නොහැකි යම් නඩු භාණ්ඩයක් මුදා හැරීම, එම නඩු භාණ්ඩය විමර්ශනය, පුහුණුව සහ පර්යේෂණය සඳහා මුදාහරිනු ලබන අදාළ මහෙස්ත්‍රාත්වරයා හෝ නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් නිකුත් කරනු ලබන උචිත කොන්දේසිවලට යටත්ව පමණක් කරනු ලැබිය යුතු ය.

7. අවස්ථාවෝචිත පරිදි, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය විසින් හෝ බලයලත් තැනැත්තා විසින්, අවස්ථාවෝචිත පරිදි, අදාළ මහෙස්ත්‍රාත්වරයාගේ හෝ නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ අධීක්ෂණය යටතේ එම නඩු භාණ්ඩ විනාශ කිරීම හෝ විනාශ කිරීමට කටයුතු සැලැස්වීම කරනු ලැබිය යුතු අතර, එම විනාශ කිරීම පිළිබඳව එම අධිකරණය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

8. නඩු භාණ්ඩ නිදහස් කිරීම සඳහා හෝ නඩු භාණ්ඩ හෝ එහි යම් කොටසක් විනාශ කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයා හෝ නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් අඥාවක් ලබාදීමෙන් පසුව, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය විසින් හෝ බලයලත් තැනැත්තා විසින් –

(අ) 77අ වන වගන්තියේ (5) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති කටයුතු ඉටුකිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයාගෙන් හෝ නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයෙකුගෙන් සුදුසු දිනයක් සහ වේලාවක් ඉල්ලා සිටිය යුතු ය ; සහ

(ආ) එම විනාශ කිරීම් සිදුකරන පරිශ්‍රය වෙත පැමිණෙන ලෙස ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වෙත දැනුම්දිය යුතු ය.

එසේ වුව ද, මොෆීන්, හෙරොයින්, කොකේන්, මෙත්ඇම්පිටමීන් සහ ගංජා සහ ශාක පදනම් වූ ඖෂධවල යම් ඕනෑම ආකාරයක ඖෂධයක්, ද්‍රව්‍යයක්, භාණ්ඩයක් හෝ සැකසුමක් සහ ආඥාපනතේ II වන උපලේඛනයේ I වන කොටසේ හා II වන කොටසේ නිශ්චිතව දක්වා ඇති අන්තරායදායක ඖෂධයක කෘතීම හෝ අර්ධ කෘතීම සැකසුමක් හෝ එහි යම් ඖෂධයක, ද්‍රව්‍යයක හෝ භාණ්ඩයක බැහැර කිරීමේ බර ග්‍රෑම් 1000ක් ඉක්මවනු ලබන අවස්ථාවක දී, අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය විසින් බලය පවරනු ලබන නිලධරයකු එම විනාශ කිරීම සිදුකරනු ලබන ස්ථානයේ සිටිය යුතු ය.

(ඇ) එම නඩු භාණ්ඩ සඳහා අවශ්‍ය ආරක්ෂාව සලසා තිබේ ද යන්න සහ (අවශ්‍ය වේ නම්) එම නඩු භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා කටයුතු සලසා තිබේ ද යන්න පිළිබඳව සහතික විය යුතු ය.

(ඈ) නඩු භාණ්ඩ ඉන්වෙන්ටරියේ නිවැරදිභාවය පිළිබඳ සහතික විය යුතු ය.

(ඉ) ඇසුරුම්වල සහ මුද්‍රාවල මෙන්ම අනෙකුත් සාක්ෂිවල අවශ්‍ය ඡායාරූප ගැනීම සහ ඒවා නඩු භාණ්ඩ ලිපිකරු වෙත ආපසු භාරදීම සිදු කළ යුතු ය.

(ඊ) විද්‍යාත්මක පර්යේෂණ සහ සටහන් කිරීම් සඳහා බර ප්‍රමාණය ග්‍රෑම් 1ක් නොඉක්මන එම නඩු භාණ්ඩවල යම් සාම්පලයක් ලබා ගැනීම සඳහා අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය වෙත අවසර ලබාදිය යුතු ය ; සහ

(උ) අදාළ මහෙස්ත්‍රාත්වරයා හෝ නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් නිකුත් කරනු ලබන ආඥාවට අනුව නඩු භාණ්ඩ යෝග්‍ය බැහැර කිරීමේ බහාලුම් වෙත මාරු කිරීම සහ බැහැර කිරීම සඳහා සූදානම් කිරීම සඳහා එම භාණ්ඩ මුද්‍රා තැබීම කරනු ලැබිය යුතු ය.

9. (1) අධිකරණ නියෝගය ප්‍රකාරව, අවස්ථාවෝචිත පරිදි, එම නඩු භාණ්ඩ විනාශ කිරීම හෝ මුදාහැරීම සිදුකිරීමේ දී, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය විසින් හෝ බලයලත් තැනැත්තා විසින්, අවස්ථාවෝචිත පරිදි, විනාශ කිරීමේ හෝ මුදා හැරීමේ සහතිකයක් අදාළ අධිකරණය වෙත දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් ඉදිරිපත් කළ යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි, විනාශ කිරීමේ හෝ මුදා හැරීමේ සහතිකය, නියම කරනු ලැබිය හැකි පිටපත් සංඛ්‍යාවකින් සකස්කරනු ලැබිය යුතු අතර, එම විනාශ කිරීම හෝ මුදා හැරීම සඳහා පැමිණ සිටින සියලු පාර්ශ්වයන් විසින් එය අත්සන් කරනු ලැබිය යුතු ය.

(3) එම සහතිකයේ මුල් පිටපත අදාළ අධිකරණයේ ගොනු කරනු ලැබිය යුතු අතර –

(අ) නඩු භාණ්ඩ බැහැර කරනු ලබන අවස්ථාවක දී, එම සහතිකයේ ඉතිරි පිටපත් සංඛ්‍යාව, අවස්ථාවෝචිත පරිදි, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය හෝ බලයලත් තැනැත්තා වෙත, අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය සහ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත යවනු ලැබිය යුතු ය ; සහ

(ආ) නඩු භාණ්ඩ නිදහස් කරනු ලබන අවස්ථාවක දී, මුදාහරිනු ලබන මත්ද්‍රව්‍ය, මනෝචිකිත්සක ද්‍රව්‍ය සහ පාලනයට යටත් ද්‍රව්‍ය රැස්කිරීම සඳහා අධිකරණය විසින් නිකුත් කරන ලද ආඥාව මගින් බලය පවරන ලද තැනැත්තා වෙත එම සහතිකයේ පිටපතක් යවනු ලැබිය යුතු ය.

10. මේ නියෝගවල කාර්ය සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා විසින් එම නඩු භාණ්ඩ පරීක්ෂා කිරීමෙන් පසු වහාම අදාළ මහෙස්ත්‍රාත්වරයා හෝ නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් එම නඩු භාණ්ඩ මුදාහැරීමේ හැකියාව පිළිබඳ සළකා බලනු ලැබිය යුතු ය.

එසේ වුව ද, සුවිශේෂී අවස්ථානුගත කරුණු යටතේ අදාළ නඩු විභාගය අවසන් වන තෙක් එම නඩු භාණ්ඩ සංරක්ෂණය කර තැබීම සඳහා අධිකරණය විසින් තීරණය කරනු ලබන්නේ නම් හෝ නඩු විභාගය අවසන් වන තෙක් නඩු භාණ්ඩ සංරක්ෂණය කර තැබීම සඳහා විශේෂිත අවශ්‍යතාවයක් පවතී නම්, එවැනි අවස්ථාවක දී, මහෙස්ත්‍රාත්වරයකු විසින් හෝ නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් එම අවශ්‍යතාවය හෝ අවස්ථානුගත කරුණු පිළිබඳ වාර්තාගත කරනු ලැබිය යුතු ය.

11. මේ නියෝගවල නිශ්චිතව දක්වා ඇති පියවර ඵලදායී ලෙස සහ කාර්යක්ෂම ලෙස සම්බන්ධීකරණය කිරීම සඳහා අදාළ අධිකරණය, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය, ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සහ අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය විසින් –

(අ) මෙම නියෝගවලට අදාළ සියලු ලිපි ගනුදෙනු යොමු කරනු ලැබිය යුතු කේන්ද්‍රීය ආයතනයක් පත් කරනු ලැබිය යුතු ය.

(ආ) ලිපි හුවමාරු කටයුතු පවත්වාගෙන යාම සහ පසු විපරම් කටයුතු සිදු කළ යුතු ය ; සහ

(ඇ) ලිපි හුවමාරු කර ගැනීමේ දී විශේෂිත රජයේ විද්‍යුත් තැපැල් ලිපිනය හෝ ආරක්ෂිත විද්‍යුත් තැපැල් ලිපිනයක් භාවිත කරනු ලැබිය යුතු ය.

12. මේ නියෝගවල කාර්ය සඳහා –

''නිසි අධිකරණය'' යන්නෙන්, (218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ V වන පරිච්ඡේදය යටතේ සිදු කරනු ලබන යම් වරදක් විභාග කිරීම සඳහා වන අධිකරණ බලය ඇති අධිකරණය අදහස් වේ ;

''බැහැර කිරීමේ ස්ථානය'' යන්නෙන්, අධිකරණ නඩු භාණ්ඩ විනාශ කරනු ලැබිය යුතු අධිකරණ පරිශ්‍රය, වගා බිමක්, ආදාහනාගාරයක් හෝ අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලයට අයත් පුළුස්සා දැමීමේ පහසුකම් සහිත ස්ථානයක් අදහස් වේ ;

''අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය '' යන්නෙන්, 1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය අදහස් වේ ; සහ

''ආඥාපනත'' යන්නෙන්, (218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත අදහස් වේ.

## පළමු උපලේඛනය

**4 වන නියෝගය**

*බැහැර කිරීම සඳහා වන පිරිවිතරයන්*

**මෝෆීන්/හොරොයින්/කොකේන්**

| *බැහැර කරන ද්‍රව්‍යයේ බර* | *ක්‍රමවේදය* |
|---|---|
| ග්‍රෑම් 1000ට අඩු | 1. ඉහළ උෂ්ණත්වයක දී (අවම සෙල්සියස් අංශක 800 - උපරිම සෙල්සියස් අංශක 1100) පුළුස්සා දැමීම |
| | 2. ඉහළ උෂ්ණත්වයක දී (අවම සෙල්සියස් අංශක 800) ආදාහනාගාරයක් තුළ පුළුස්සා දැමීම |
| | 3. නටවාගත් ජලයේ දියකර සුදුසු අපවහන පද්ධතියට සෝදා හැරීම |
| ග්‍රෑම් 1000ට වැඩි | 4. ඉහළ උෂ්ණත්වයක දී (අවම සෙල්සියස් අංශක 800 - උපරිම සෙල්සියස් අංශක 1100) පුළුස්සා දැමීම |

*සටහන* :

- පූර්ව පිළියම් ක්‍රියාවලිය - අවසාදිත ද්‍රව්‍ය නොමැති වන තෙක්, ලෝහ හෝ ප්ලාස්ටික් බැරලයක/පීප්පයක දමා උණු ජලය සමග මත්ද්‍රව්‍ය හොඳින් දියකර මිශ්‍ර කළ යුතු ය.
- මිශ්‍ර කළ ද්‍රාවණය අපවහන පද්ධතියට මාරු කළ පසු, එය අධි පීඩන ජලයෙන් සෝදා හැරිය යුතු ය.
- ඉතිරි අවශේෂ කොටස් බැරලයක/පීප්පයක දමා උණු ජලයේ දියකිරීමේ ක්‍රියාවලිය නැවත නැවතත් සිදු කළ යුතු ය.

**මෙත්ඇම්පිටමීන්**

| *බැහැර කරන ද්‍රව්‍යයේ බර* | *ක්‍රමවේදය* |
|---|---|
| ග්‍රෑම් 1000ට අඩු | 1. ඉහළ උෂ්ණත්වයක දී (අවම සෙල්සියස් අංශක 800 - උපරිම සෙල්සියස් අංශක 1100) පුළුස්සා දැමීම |
| | 2. ඉහළ උෂ්ණත්වයක දී (අවම සෙල්සියස් අංශක 800) ආදාහනාගාරයක් තුළ පුළුස්සා දැමීම |
| ග්‍රෑම් 1000ට වැඩි | 4. ඉහළ උෂ්ණත්වයක දී (අවම සෙල්සියස් අංශක 800 - උපරිම සෙල්සියස් අංශක 1100) පුළුස්සා දැමීම |

*සටහන* :

- පූර්ව පිළියම් ක්‍රියාවලිය - ලෝහ හෝ ප්ලාස්ටික් බැරලයක සාමාන්‍ය ජලය සමග මත්ද්‍රව්‍යයේ අවසාදිත කොටස් නැති වන තුරු හොඳින් දියකර මිශ්‍ර කරන්න.

- අදාළ පරිශ්‍රයේ දී අධි ආරක්ෂිත ඇඳුම් ඇඳීමට නිර්දේශ කරනු ලැබේ.

**ගංජා**

| *බැහැර කරන ද්‍රව්‍යයේ බර* | *ක්‍රමවේදය* |
|---|---|
| අදාළ නැත | 1. ඉහළ උෂ්ණත්වයක දී (අවම සෙල්සියස් අංශක 800 - උපරිම සෙල්සියස් අංශක 1100) පුළුස්සා දැමීම |
| | 2. එළිමහනේ පිළිස්සීම |

*සටහන* :

- ලෝහ බැරලයක් (ලීටර් 200) හෝ විවෘත වළවල් හෝ අගල් (ඝන මීටර් 12ට නොඅඩු) මත්ද්‍රව්‍ය පිළිස්සීම සඳහා භාවිතා කරන්න.

- සියලුම තැනැත්තන් දුමාරය ඇති ප්‍රදේශයෙන් ඉවත් කරන්න.

    - දිගුකාලීන පාරිසරික ගැටළු සලකා බලා දිනකට උපරිම බර කිලෝග්‍රෑම් 100කට සීමා කිරීම.

    - පිළිස්සීමට පෙර, පූර්ණ දහනයක් සිදුවන බව තහවුරු කිරීම සඳහා වෙනත් බැහැර කරනු ලබන දාහ්‍ය ද්‍රව්‍යයක් (උදා.- කාඩ්බෝඩ්, කඩදාසි, වියළි ආහාර අපද්‍රව්‍ය, ගලි අපද්‍රව්‍ය, එළවළුවලින් ගත් තෙල් හෝ ග්‍රීස්) සහ/හෝ ඉහළ දාහ්‍ය බවකින් යුතු ද්‍රව හෝ භූමිතෙල් හෝ ඩීසල් වැනි වෙනත් ඉන්ධන) අවම වශයෙන් සමාන ප්‍රමාණයක් (1 : 1 අනුපාතය) සමග ඇඹරීම හෝ මිශ්‍ර කිරීම සඳහා නිර්දේශ කරනු ලැබේ.

    - පිළිස්සීම සිදුකරනු ලබන ස්ථානය තෝරා ගැනීමේදී පහත කරුණු සලකා බලන්න :

        - මිනිස් වාසස්ථාන, ජල මාර්ග, ළිං, විදුලි රැහැන්, වනාන්තර සහ ආහාර වගා කරන/නිෂ්පාදන/ප්‍රේක්ෂණ ප්‍රදේශයේ සිට අවම වශයෙන් මීටර් 500ක් දුරින්,

        - ජල මාර්ග සහ දෘඩ පෘෂ්ඨලින් ඈත් වූ උස් වූ සහ පැතලි භූමි ප්‍රදේශයක්.

**වෙනත් කෘත්‍රිම හෝ අර්ධ කෘත්‍රිම ඖෂධ**

| *බැහැර කරන ද්‍රව්‍යයේ බර* | *ක්‍රමවේදය* |
|---|---|
| උපරිම : පැයකට කිලෝග්‍රෑම් 50 | ඉහළ උෂ්ණත්වයක දී (අවම සෙල්සියස් අංශක 800 - උපරිම සෙල්සියස් අංශක 1100) පුළුස්සා දැමීම |

**වෙනත් ශාක පදනම් වූ ඖෂධ**

| *බැහැර කරන ද්‍රව්‍යයේ බර* | *ක්‍රමවේදය* |
|---|---|
| අදාළ නැත | 1. ඉහළ උෂ්ණත්වයක දී (අවම සෙල්සියස් අංශක 800 - උපරිම සෙල්සියස් අංශක 1100) පුළුස්සා දැමීම |
| | එළිමහනේදී පිළිස්සීම |

*සටහන* :

- මත්ද්‍රව්‍ය පිළිස්සීම සඳහා ලෝහ බැරලයක් (ලීටර් 200) හෝ විවෘත වළවල් හෝ අගල් (ඝන මීටර් 12ට නොඅඩු) භාවිතා කරන්න.

- සියලුම පුද්ගලයින් දුමාරයෙන් ඉවත්ව තබන්න.

    - දිගුකාලීන පාරිසරික ගැටළු සලකා බලා දිනකට උපරිම බර කිලෝග්‍රෑම් 100කට සීමා කිරීම.

    - පිළිස්සීමට පෙර, පූර්ණ දහනයක් සිදු වන බව තහවුරු කිරීම සඳහා වෙනත් බැහැර කරනු ලබන දාහ්‍ය ද්‍රව්‍යයක් (උදා.- කාඩ්බෝඩ්, කඩදාසි, වියළි ආහාර අපද්‍රව්‍ය, ගලි අපද්‍රව්‍ය, එළවළුවලින් ගත් තෙල් හෝ ග්‍රීස්) සහ/හෝ ඉහළ දාහ්‍ය බවකින් යුතු ද්‍රව හෝ භූමිතෙල් හෝ ඩීසල් වැනි වෙනත් ඉන්ධන) අවම වශයෙන් සමාන ප්‍රමාණයක් (1 : 1 අනුපාතය) සමග ඇඹරීම හෝ මිශ්‍ර කිරීම සඳහා නිර්දේශ කරනු ලැබේ.

    - පිළිස්සීම සිදුකරනු ලබන ස්ථානය තෝරා ගැනීමේ දී පහත කරුණු සලකා බලන්න :

        - මිනිස් වාසස්ථාන, ජල මාර්ග, ළිං, විදුලි රැහැන්, වනාන්තර සහ ආහාර වගා කරන/නිෂ්පාදන කරන තෘණ භූමි ආදියේ සිට අවම වශයෙන් මීටර් 500ක් දුරින්,

        - ජල මාර්ග සහ දෘඪ පෘෂ්ඨවලින් ඈත් වූ උස් වූ සහ පැතලි භූමි ප්‍රදේශයන් තෝරා ගත යුතුය.

**දෙවන උපලේඛනය**

**9 වන නියෝගය**

**විනාශ කිරීම/මුදා හැරීම පිළිබඳ සහතිකය**

මෙහි පහත සඳහන් මත්ද්‍රව්‍ය, මනෝවිද්‍යාත්මක ද්‍රව්‍ය සහ පාලනයට යටත් කොට ඇති ද්‍රව්‍ය විනාශ කරන/මුදා හරින ලද බවට සහතික කරනු ලැබේ.

1. නඩු අංකය :
2. මත්ද්‍රව්‍ය, මනෝවිද්‍යාත්මක ද්‍රව්‍යවල සහ පාලනයට යටත් කොට ඇති මූලද්‍රව්‍ය :
3. අධිකරණයට ඉදිරිපත් කරන ලද මත්ද්‍රව්‍යවල දළ බර :
4. විනාශ කරන ලද හෝ මුදාහරින ලද මත්ද්‍රව්‍ය, මනෝවිද්‍යාත්මක ද්‍රව්‍යවල සහ පාලනයට යටත්කොට ඇති මූලද්‍රව්‍යවල ශුද්ධ බර (සාම්පල ලබා ගැනීමෙන් පසු) :
5. විස්තරයේ නිවැරදි බව තහවුරු කර ඇත : ඔව්/නැත
6. බැහැර කිරීම/මුදා හැරීමේ ප්‍රදේශය :
7. බැහැර කිරීම/මුදා හැරීමේ ක්‍රමවේදය :
8. දිනය :
9. ආරම්භක වේලාව :
10. අවසන් වේලාව :

**අධිකරණය විසින් බලය පවරන ලද නිලධාරියාගේ විස්තර :**

අත්සන :

නම :

තනතුර :

විස්තර කරනු ලැබ ඇති පරිදි ඉහත සඳහන් කළ මත්ද්‍රව්‍ය, මනෝවිද්‍යාත්මක ද්‍රව්‍යවල සහ පාලනයට යටත් මූලද්‍රව්‍ය ඉහත කී ප්‍රදේශයට බැහැර කිරීම/නිදහස් කිරීම සිදුකළ බවට සාක්ෂි පිණිස –

1. අධීක්ෂණය කරනු ලබන අධිකරණ නිලධාරියාගේ අත්සන සහ නම ඃ

2. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයින්ගේ අත්සන (අත්සන්) සහ නම (නම්) ඃ

3. අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලයේ නියෝජිතයින්ගේ අත්සන (අත්සන්) සහ නම (නම්) ඃ

4. අධිකරණ විසින් බලය පවරන ලද නිලධාරියාගේ/නිලධාරී මණ්ඩලයේ හෝ නීතිඥවරයාගේ අත්සන (අත්සන්) සහ නම (නම්) ඃ

5. මුදාහරින ලද, අන්තරායදායක ඖෂධ, මනෝචිකිත්සක ද්‍රව්‍යවල සහ පාලනයට යටත් මූලද්‍රව්‍ය රැස්කරන ලද බලයලත් නිලධාරියාගේ අත්සන (අත්සන්) සහ නම (නම්) ඃ

EOG 11 - 0316

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.